// කෘෂි තාක්ෂණ තොරතුරු

කෘෂි තාක්ෂණ තොරතුරු කඩිනමින් ගොවි ජනතාව අතරට ලබා දීමේ අත්වැලකි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂි තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි.

තාක්ෂණික පත්‍රිකා අංක 08 - 2018 මැයි

තාක්ෂණික පත්‍රිකා අංක 08 හි නව සංශෝධිත මුද්‍රණය

# 2018 නිරිත දිග මෝසම් වැසි (මැයි - ජූලි)

සාමාන්‍ය යල කන්නයකදී ලැබෙන නිරිත දිග මෝසම් වර්ෂාවට වඩා වැඩි වර්ෂාවක් 2018 නිරිත දිග මෝසම් කාලය තුලදී දිවයිනේ මධ්‍යම, නැගෙනහිර හා දකුණු පළාත් වලට ලැබෙනු ඇති බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මේ වන විට අනාවැකි එල කර ඇත.

එහෙත් කුරුණෑගල ප්‍රදේශයේ අතරමැදි කලාප (11-1a ප්‍රදේශය) හැරුණු විට දිවයිනේ අනෙකුත් වියලි හා අතරමැදි කලාප වලට නිරිත දිග මෝසම මඟින් ප්‍රමාණවත් වර්ෂාවක් නොලැබෙනු ඇත.

වියලි හා අතරමැදි කලාප තුළ පිහිටි මහා වාරිමාර්ග හා සුළු වාරි මාර්ග වලින් ඉතා ස්වල්පයක් හැරුණු විට අනෙකුත් බොහෝමයක වාරි පද්ධති මෙම කන්නය ආරම්භයේදී ප්‍රමාණවත් තරම් ජලධාරිතාවක් නොවීය. ඉහතින් සඳහන් කලාක් මෙන් නිරිත දිග මෝසම් මඟින්ද මෙම වාරි පද්ධතියන්හි පෝෂක පෙදෙස් වලට ප්‍රමාණවත් පරිදි ජලය නොලැබීමත්, මැයි මාසයේ සිට අගෝස්තු මස ආරම්භය දක්වා පවතින අධික වාෂ්පීකරණයන් යන හේතු නිසා දැනට ඒවායේ පවතින ජල ධාරිතාවද කාලයත් සමඟ පහත වැටෙනු ඇත. එබැවින් එවැනි පෙදෙස් වල වගාවක් ආරම්භ කිරීමේදී ජල හිඟතාවයකට මුහුණ දීමට සිදුවිය හැකි නිසා එය මග හරවා ගැනීමට සහ සිදුවිය හැකි හානි අවම කිරීමට පහත ක්‍රියාමාර්ග නිර්දේශ කෙරේ.

- කෙසේ හෝ මෙම පෙදෙස් වලට ඉදහිට ඇද වැටෙන සුළු වර්ෂාවන් අපතේ යාමට නොදී ඒවා උපයෝගී කර ගෙන බිම් සකස් කිරීම ආරම්භ කිරීම මඟින් ජලාශ වල දැනට පවතින ජලය ඉදිරි බෝග පාලන කටයුතු සඳහා ඉතිරි කර ගත හැක. හොඳින් භූමිය මට්ටම් කර ගැනීමට සැලකිලිමත් වන්න. එමඟින් ජලය භාවිතයේ කාර්යක්ෂමතාවය ඉහළ නංවාගත හැක.
- මෙවැනි වාරි මාර්ග යටතේ වගාවන් පිහිටු වීමට පෙර පවතින ජල ප්‍රමාණයට සරිලන වගා වපසරියක් තෝරාගත යුතුය. එමෙන්ම වගා කිරීමට තෝරා ගන්නා බෝග කෙටි කාලීන මෙන්ම ජල හිඟයට ඔරොත්තු දෙන ඒවා විය යුතුය. වී බෝග වගා කල හැකි අවස්ථා වලදී මාස 3 වයස් කාණ්ඩයේ හෝ ඊට අඩු වයස් කාණ්ඩයේ වී ගොවිතැන් කිරීම සුදුසු වේ. ජල හිඟයට ඔරොත්තු දෙන කෙටි කාලීන අතිරේක බෝග වන රට කජු, තල, කව්පි, උඳු හා සෝයා බෝංචි ද වගාව සඳහා යොදා ගත හැකිය.
- අවශ්‍ය ස්ථාන වලදී ගොවි සංවිධාන වලට බෙත්ම ක්‍රමය යටතේ වගාව පිහිටු වීම සිදු කළ හැකිය.
- වී වගා කරන අවස්ථාවේ බෝග පිහිටුවීමට පැරෂුට් ක්‍රමය වඩාත් සුදුසු වේ. වගාව භාවිතා කරන බීජ දිරියෙන් ඉහල ගුණාත්මක බීජ විය යුතුය. එවැනි බීජ භාවිතා කළ වගාවන්හට අහිතකර තත්ව වලට වඩා හොඳින් ඔරොත්තු දිය හැක.

වියලි හා අතරමැදි කලාප වල උස්බිම් වල වගාව පිහිටුවන්නේ නම් අමතර ජල සම්පාදනයක් සඳහා සුදුසු වාරි පහසුකම් තිබිය යුතුය. උදා: කෘෂි ලිං හැකි සෑම විටම ප්‍රමාණවත් පරිදි කාබනික පොහොර බෝගය අසල පසට එකතු කිරීම මඟින් පසෙහි ජලය රඳවා ගැනීමේ හැකියාව ඉහල දැමිය හැක.

කුමන බෝගයක් කුමන ස්ථානයක වගා කලද සෑම විටකම බෝගය අසලට ප්‍රමාණවත් පරිදි කාබනික පොහොර පසට එකතු කර ගැනීමෙන් පසේ ජලය රඳවා ගැනීමේ හැකියාව ඉහල නැංවිය හැක. එමඟින්

ජලය සැපයිය යුතු වාර ගණන අඩු කර ගත හැකිය. උස් බිම් වල වගා කිරීමේදී බෝග අතර භූමිය වැසෙන පරිදි වසුනක් යෙදීමෙන්ද පසෙන් ජලය වාෂ්පීකරණය වීම අඩු කිරීමට හේතු වනු ඇත.

ජල සම්පාදන ක්‍රියාමාර්ග කාර්යක්ෂම කිරීම.

- වාරි මාර්ග පද්ධති වල සූක්ෂම ජල පරිහරණ රටාවකට ගොවීන් අනුගත වීම අත්‍යාවශ්‍ය වනු ඇත.
- හොඳින් නියර සකසන්න. වී වගාවේදී ලියදි වලට ජලය හැරවූ පසු වතුර බැස යන වක්කඩ වසා තබන්න. එවිට ජලය අපතේ යාම වලකී. ලියද්ද තුලදීම ජලය පස තුලට කාන්දු වීම සිදු වේ.
- නියර මඟින් ජලය ගලා යන ලෙසට ජලය හැරවීමෙන් වලකින්න.
- වාරි පද්ධතිය තුල ජලය අපතේ හැරීමට කටයුතු කරනු ලබන අයට විරුද්ධව නීත්‍යානුකූලව පියවර ගැනීමට කටයුතු කිරීම.

වියලි හා අතරමැදි කලාප වල වී වගා කිරීමට තරම් ප්‍රමාණවත් ජලය නොමැති වීම අතිරේක බෝග වලටත්, අතිරේක බෝග වලට ද ජලය ප්‍රමාණවත් නොවේ නම් කෙටි කාලීන එළවළු හා පලා වර්ග වගා කිරීමෙන් භූමියේ ඵලදායීතාවය ඉහළ මට්ටමක රඳවා ගත හැක.

**තෙත් කලාපය**

නිරිත දිග මෝසමෙන් ප්‍රමාණවත් පරිදි ජලය ලැබෙන තෙත් කලාපික ප්‍රදේශ වලදී, ජාතික ආහාර නිෂ්පාදනය තහවුරු කරවීමට අතහැර දමා තිබෙන වගා කල හැකි කුඹුරු ඉඩම් නැවත වගා කිරීමට ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දීමට සැලකිලිමත් විය යුතුය.

**තාක්ෂණික කරුණු -:** ආචාර්ය බී.වී.ආර්. පුන්‍යාවර්ධන (ප්‍රධාන විද්‍යාඥ / ප්‍රධානී, කෘෂි කාලගුණ හා දේශගුණ විපර්සාය අංශය)

ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය, පේරාදෙණිය

ජේ.ආර්. සුදසිංහ (අතිරේක අධ්‍යක්ෂ - කෘෂි ව්‍යාප්ති), ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, පේරාදෙණිය

සැකසුම : අයි.එස්.එම්. හලීම්දීන් (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ), එන්.ඒ.එම් ගුණවර්ධන (කෘෂිකර්ම උපදේශක)
කේ.එම්. සිරිවර්ධන (තාක්ෂණික සහකාර - කෘෂි ව්‍යාප්ති)

අධීක්ෂණය හා උපදෙස් : එස්. පෙරියසාමි (අධ්‍යක්ෂ - තොරතුරු හා සන්නිවේදන)